පොලිස්පති චක්‍ර ලේඛ අංක : 2031 / 2007
අපරාධ චක්‍ර ලේඛ අංක : 17 / 2007

මගේ අංකය: C7 / 133 / 07
පොලිස් මූලස්ථානය
කොළඹ 01
2007.11.22

සියලුම ජ්‍යෙ.නි.පො.ප./ නි.පො.ප. වරුන්,
කොට්ඨාශ භාර නිළධාරීන්,
දිස්ත්‍රික් භාර නිළධාරීන් හා,
සියලුම ස්ථානාධිපතිවරුන් වෙත,

## " ශබ්ද විකාශණ යන්ත්‍ර බලපත්‍ර නිකුත් කිරීම "

ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් ඉල්ලුම් පත්‍ර 38/05 නඩුව සම්බන්ධයෙන් 2007.11.09 වන දින නිකුත් කරන ලද නඩු තීන්දුවට අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි මින් ඉදිරියට ශබ්ද විකාශන බලපත්‍ර නිකුත් කිරීම සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග පිළිබඳ පහත සඳහන් උපදෙස් ක්‍රියාත්මක කරන ලෙස සියලුම තරාතිරම්වල පොලිස් නිළධාරීන්ට මෙයින් උපදෙස් දෙමි.

ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චිය හා බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පොලිස් ආඥා පනතේ 80 වගන්තියේ හා දෙපාර්තමේන්තු නියෝග ඊ . 4 හි සඳහන් විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් නියෝග පොලිස් මූලස්ථානය මගින් මේ දක්වා නිකුත් කර ඇත.

i 1960.04.27 දින අංක 5537 දරණ පො.ගැ.II පත්‍රයේ 69 පිටුවේ සී.අයි. 4138/එම් අංකය යටතේ පලවී ඇති නිවේදනය

ii 1971.10.20 දින අංක 6133 දරණ පො.ගැ. .II පත්‍රයේ 153 පිටුවේ අංක එම්.එල්. 300/71 අංකය යටතේ පලවී ඇති නිවේදනය

iii. 1979.07.04 දින අංක 43 දරණ පො ගැ .II පත්‍රයේ 183 පිටුවේ අංක එම්.පී. 54/64 එම්.එල්. අංකය යටතේ පලවී ඇති නිවේදනය

iv 1983.08.11 දින අංක 511/83 දරණ මූලස්ථාන චක්‍ර ලේඛය

v 1983.09.28 දින අංක 264 දරණ පො ගැ .II පත්‍රයේ එෆ්.ජී. 42 / 83 අංකය යටතේ පලවී ඇති නිවේදනය

vi 1986.09.24 දින අංක 420 දරණ පො ගැ .II පත්‍රයේ 247 වන පිටුවේ ඊ.ඔ. 4 / 134/86 අංකය යටතේ පලවී ඇති නිවේදනය

vii 1991.03.12 දින අංක 908/91 දරණ පොලිස්පති චක්‍ර ලේඛය ( රථවාහන චක්‍ර ලේඛ 53/91)

viii 2001.06.11 දින අංක 1581/01 දරණ පොලිස්පති චක්‍ර ලේඛයේ අංක 07 ඡේදය ( ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍ර ගාස්තු අය කිරීම)

ix 2004.02.23 දින අංක 1763/04 දරණ පොලිස්පති චක්‍ර ලේඛය ( අපරාධ චක්‍ර ලේඛ අංක 03/04 )

ඉහත අංක ii, iii, vi,vii හා viii වශයෙන් ඉහත දක්වා ඇති චක්‍ර ලේඛ හා පොලිස් ගැසට් නිවේදන වල බලපැවැත්ම තවදුරටත් පවතින අතර, අංක i, iv,v., හා ix වශයෙන් දක්වා ඇති චක්‍ර ලේඛ හා පොලිස් ගැසට් නිවේදනයන්හි බලපැවැත්ම වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයින් අහෝසි කරනු ලැබේ.

**ශ්‍රේෂ්ඨාධිකරණය මූලික අයිතිවාසිකම් ඉල්ලුම් පත්‍ර 38 / 05 දරණ නඩු තීන්දුව ප්‍රකාර ශබ්ද විකාශන බලපත්‍ර නිකුත් කිරීම හා සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කර ඇති නියෝග :**

i ශබ්ද විකාශන යන්ත්‍ර ඇම්ප්ලිෆයර් හෝ ඒ සමාන උපකරණ භාවිතා කිරීමෙන් නිකුත් කරන ශබ්දය මගින් අවට පදිංචි මහජනතාවට හෝ පදිංචි කරුවන්ට හෝ දේපල දරන්නන්ට අපහසුතාවයක් කරදරයක් ඇති කරවීම ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 261 වන වගන්තිය යටතේ මහජන පීඩාවක් ලෙස සලකනු ලැබේ. පොලිසිය විසින් මෙවැනි පැමිණිලි සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන එවැනි මහජන පීඩා ඇති කරන්නන් හට විරුද්ධව ක්‍රියා කල යුතුය.

ii මේ දක්වා පොලිසිය විසින් පොලිස් ආඥා පනතේ 80 (1) වගන්තිය යටතේ නිකුත් කර ඇති සියලුම බලපත්‍ර වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු වේ.

iii පොලිස් ආඥා පනතේ 80 (1) වගන්තිය යටතේ රාත්‍රී 10.00 සිට පසුදින උදේ 06.00 දක්වා කාලයට වලංගු වන සේ ශබ්ද විකාශන යන්ත්‍ර හෝ ඒ ආකාරයේ වෙනත් උපකරණ මගින් අදාල වගන්තියේ සඳහන් කර ඇති ආකාරයට ශබ්දය විස්තාරණය කිරීම සඳහා කිසිම බලපත්‍රයක් නිකුත් නොකල යුතුය. මෙම කාලය තුලට වලංගු වන එවැනි බලපත්‍රයක් නිකුත් කල හැක්කේ විශේෂ ආගමික උත්සවයක් හා අතිශයින් විශේෂ අවස්ථාවන් සඳහා පමණක් වන අතර, එවැනි අවස්ථාවන් හිදී අවට පදිංචිකරුවන් ගෙන් විමසා බලා ඒ පිළිබඳ නිසි වාර්තා තබා ගත යුතු අතර, ඉන් පසු එම බලපත්‍රය නිකුත් කර ඒ සම්බන්ධයෙන් ආසන්නතම මහේස්ත්‍රාත් වරයාට හැකි ඉක්මනින් වාර්තා කල යුතුය.

iv උදෑසන 06.00 සිට පැය 22.00 දක්වා කාලය තුල වලංගු වන සේ නිකුත් කරන ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍ර එම කාර්යට අදාල කාල සීමාවට පමණක් සීමාවනයේ විශේෂිත කාරනා සඳහා පමණක් නිකුත් කිරීම, ශබ්ද විකාශන යන්ත්‍ර වලින්, ඇම්ප්ලිෆයර් වලින් හෝ එවැනි උපකරණ වලින් නිකුත් කරන ශබ්ද අදාල බලපත්‍රය නිකුත් කරන පරිශ්‍රයේ සීමාවෙන් ඔබ්බට එම ශබ්දය විස්තාරනය නොවන ලෙසට වග බලා ගත යුතු අතර, ඒ සඳහා විධිමත් වූ කොන්දේසි වලට යටත්ව බලපත්‍ර නිකුත් කිරීම සිදු කල යුතුය.

v පොලිස් ආඥා පනතේ 80 (1) වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍ර නිකුත් කිරීමේදී ඉහතින් දැක්වූ iii සහ iv වන රෙගුලාසි උල්ලංඝණය නොවන පරිදි ක්‍රියා කරන්නේද යන්න පරීක්ෂා කිරීමට සහ නිකුත් කරන ලද බලපත්‍රයේ

කොන්දේසි හරයේ ක්‍රියාත්මක කරන්නේද යන්න පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් පොලිස් නිළධාරීන් යෙදවීමට කටයුතු කල යුතුය.

vi ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 261 වන වගන්තිය යටතේ දක්වා ඇති වැරදි පිළිබදව යම් යම් පුද්ගලයින් ට විරුද්ධව කරනු ලබන පැමිණිලි හා පොලිස් ආඥා පනතේ 80 (1) වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ශබ්ද විකාශන යන්ත්‍ර ඇම්ප්ලිෆයර් හෝ වෙනත් උපකරණ භාවිතා කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ලද බලපත්‍ර වල කොන්දේසි හා උපදෙස් උල්ලංගණය කරමින් භාවිතා කරන බවට කරනු ලබන පැමිණිලි සටහන් කර ගැනීමට පොලිසිය විශේෂ ක්‍රියාමාර්ගයක් පිලියෙල කිරීමත්, ඒ පිළිබදව විමර්ශණය කිරීමටත්, එම කොන්දේසි උල්ලංගණය කරන පුද්ගලයින්ට එසේ නොකරන ලෙස අවවාද කිරීමට ක්‍රියා කල යුතු අතර, එම අවවාද වලට පටහැනිව ක්‍රියා කරන්නේ නම් පොලිස් ආඥා පනතේ 80 (4) උප වගන්තිය යටතේ එම භාණ්ඩ හා උපකරණ පොලිස් භාරයට ගෙන රදවා තබා ගැනීමට කටයුතු යුතු කර මෙම සිද්ධීන් පිළිබදව ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරී වෙත වාර්තා කල යුතුය.

(උක්ත නඩු තීන්දුවේ නිකුත් කරන ලද ඉංග්‍රීසි පිටපතක් මෙයට යාකර ඇත)

**ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය අනුව ක්‍රියා කිරීමේදී සියලුම තරාතිරමේ නිළධාරීන් විසින් පහත සදහන් උපදෙස් හරයේ පිලිපැදිය යුතුවේ.**

1. ඉහත උපදෙස් මාලාවේ ii නියෝගයට අනුව මේ වන විටත් 2007.11.09 වන දින වන විට පොලිසිය මගින් නිකුත් කර ඇති සියලුම ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍ර අවලංගු සේ සැලකිය යුතුය. ඒ සදහා නව බලපත්‍ර නිකුත් කිරීමේදී ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දී ඇති නියෝග හා උපදෙස් අනුව ක්‍රියා කිරීමට සියලුම දිසාභාර / කොට්ඨාශ භාර / දිස්ත්‍රික් භාර / ස්ථාන භාර නිළධාරීන් නිළධාරීන් කටයුතු කල යුතුය.

2. ශ්‍රේෂ්ඨාධිකරණ රෙගුලාසියේ iv වන රෙගුලාසියට අනුව මින් ඉදිරියට දිස්ත්‍රික් භාර නිළධාරීන් උදෑසන 06.00 සිට රාත්‍රී 10.00 දක්වා කාලය තුලදී පාවිච්චි කිරීම සදහා ශබ්ද විකාශන බලපත්‍ර නිකුත් කරනු ලබන අවස්ථාවන්හිදී එම අදාල උත්සවයට නැතහොත් එම කාර්යට ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීමට අවශ්‍යවන කාලසීමාවට පමණක් සීමා කර බලපත්‍රය නිකුත් කිරීමට වගබලා ගත යුතුය.

උදා. i දහම් පාසැල්, ළදරු පාසැලක තෑගි බෙදා දීමක්, ක්‍රීඩා උත්සවයක් පැය 14.00 සිට පැය 16.00 දක්වා පැවැත්වේ නම් බලපත්‍රය එම කාලයට පමණක් සීමාවනසේ නිකුත් කල යුතුය.

ii. රැස්වීම් ආදිය සදහා බලපත්‍ර නිකුත් කිරීමේදී රැස්වීමේ පලමු කථිකයා (පිළි ගැනීමේ කථාව) ආරම්භ කරන වේලාවේ සිට අවසාන කථාව (ස්තුති කථාව) කාලසීමාවට පමණක් සීමාවන කාල පරාසයකට බල පත්‍ර නිකුත් කල යුතුය.

සැ.යු : මෙහිදී විශේෂයෙන් අදාල උත්සවය පටන් ගැනීමට පැය ගණනකට කලින් සිට පටිගත කල ගීත, සාකච්ඡා යනාදිය ප්‍රචාරය කර ගැනීමට හැකි වන පරිදි බල පත්‍ර නිකුත් කිරීම සිදු නොකිරීමට තරයේ වග බලා ගත යුතුය.

3. රාත්‍රී 10.00 සිට උදේ 06.00 දක්වා කාලය තුලට බල පවත්නා සේ බලපත්‍ර නිකුත් කිරීම සඳහා අවසරදී ඇත්තේ විශේෂ ආගමික උත්සව වලට සහ වෙනත් විශේෂ අවස්ථා සඳහා පමණි. මෙහිදී විශේෂ ආගමික උත්සව යනුවෙන් සලකනු ලබන්නේ ඉතා විශේෂ වැදගත් කමක් ඇති ජාතික මට්ටමින් සලකනු ලබන ආගමික උත්සවයන් වන අතර, වෙනත් විශේෂ අවස්ථා වශයෙන් සලකනු ලබන්නේද ජාතික වශයෙන් වැදගත් කමක් දක්වන අවස්ථා පමණක් වේ.

4 රාත්‍රී 10.00 සිට උදේ 06.00 දක්වා කාලය තුල සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථම අදාල ස්ථානාධිපති වරයා විසින් බලපත්‍ර නිකුත් කරනු ලබන ස්ථානයේ අවට ප්‍රදේශයන්හි පදිංචි කරුවන් ගෙන් (එම ශබ්දය ඇසෙන සීමාවේ) ඒ පිළිබඳව විමසා ඒ පිළිබඳව අදහස් හා විරෝධතා වාර්තා කරවා ගත යුතුය. මේ හා සම්බන්ධයෙන් මූලිකව පැවැත්විය යුතු පරීක්ෂණ සඳහා සෑම විටම පොලිස් සැරයන් තනතුරෙන් ඉහල තනතුරක් දරණ නිළධාරියකු යෙදවිය. යුතු අතර, ඔහු විසින් එහිදී ඒ සම්බන්ධයෙන් සවිස්තර ලිඛිත වාර්තාවක් ස්ථානාධිපති වෙත ඉදිරිපත් කල යුතුවේ. අදාල ස්ථානාධිපති වරයා එම වාර්තාව පරීක්ෂා කර බලා දක්වා ඇති කරුණු සනාථ කර තම නිර්දේශයන් දිස්ත්‍රික් භාර නිළධාරියා වෙත ඉදිරිපත් කල යුතු අතර, දිස්ත්‍රික් භාර නිළධාරියා කොට්ඨාශ භාර නිළධාරියා මගින් දිසාභාර නි.පො.ප. වරයා වෙත යොමු කල යුතුය. .

5 මෙවැනි විශේෂ උත්සවයක් සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමේදී අදාල විශේෂ ආගමික උත්සවය හා වෙනත් විශේෂ අවස්ථාව කුමක්ද යන්න තීරණය කරනු ලබන්නේ දිසාභාර නියෝජ්‍ය පොලිස්පති වරයාය. මෙහිදී නි.පො.ප. වරයා මෙහි දැක්වෙන නියෝගයන් එමෙන්ම ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගයට අනුකූලව එම විශේෂ ආගමික උත්සවය හෝ වෙනත් විශේෂ අවස්ථාව කුමක්ද යන්න වගකීමෙන් යුක්තව තීරණය කර බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලිඛිත නියෝගයක් කොට්ඨාශ භාර නිළධාරියා මගින් දිස්ත්‍රික් භාර නිළධාරියා වෙත යොමු කල යුතුවේ. එම නි.පො.ප. වරයාගේ අනුමැතිය මත පමණක් රාත්‍රී 10.00 සිට උදේ 06.00 දක්වා වූ කාලය තුල ශබ්ද වාහිනී බලපත්‍ර නිකුත් කිරීම සිදුකල යුතු වන බවට සියලුම කොට්ඨාශ භාර නිළධාරීන් / දිස්ත්‍රික් භාර නිළධාරීන් වගකීමෙන් යුතුව සටහන් කර ගත යුතුවේ.

6. නියෝජ්‍ය පොලිස්පති වරයාගේ අනුමැතිය ප්‍රකාර එවැනි බලපත්‍රයක් නිකුත් කල වහාම අප්‍රමාදව ඒ සම්බන්ධයෙන් ලගම මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත් වරයා වෙත අදාල දිස්ත්‍රික් භාර නිළධාරියා විසින් කරුණු වාර්තා කල යුතු වන අතර, ඒ පිළිබඳ විස්තර විශේෂයෙන් නඩු අංකය, මහේස්ත්‍රාත් අධිකරණය, පවත්වන ලද පරීක්ෂණයන්හි සටහන් පිළිබඳ වාර්තා දිස්ත්‍රික් භාර නිළධාරියාගේ කාර්යාලයේ තබා ගත යුතුය. යම් හෙයකින් එවැනි ඉල්ලම් කර ඇති අයදුම් පතක් සඳහා බලපත්‍ර නිකුත් කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට හේතු වුවහොත්, එම කරුණුද අධිකරණය වෙත වාර්තා කල යුතුය.

සෑ : යු. රාත්‍රී 10.00 සිට උදේ 06.00 දක්වා කාලය තුල බලපත්‍ර නිකුත් කිරීම ඉහත දක්වා ඇති පරිදි සිදුවන හෙයින් ඉහත උපදෙස් වලට සම්ප වන ඉල්ලුම් පත්‍ර පමණක් භාරගෙන ඉහත නියෝග 4 දැක්වෙන ප්‍රකාර අවශ්‍ය කටයුතු කිරීමට සියලුම කොට්ඨාශ භාර / දිස්ත්‍රික් භාර / සථාන භාර නිළධාරීන් වගකීමෙන් කටයුතු කල යුතුය.

7 මෙම බලපත්‍ර නිකුත් කිරීම ඉතා වගකීමකින් සිදුකල යුතු අතර, මෙම බලපත්‍ර නිකුත් කිරීමේදී ( පැය 06.00 සිට පැය 22.00 දක්වා / පැය 22.00 සිට පැය 06.00 දක්වා ) එමගින් කිසිම අවස්ථාවකදී මහජන පීඩාවන් සිදුනොවන ආකාරයට කටයුතු කිරීමට වග බලා ගැනීම කොට්ඨාශ භාර / දිස්ත්‍රික් භාර / ස්ථාන භාර නිළධාරීන්ගේ මූලික වගකීමක් වනු ඇත. විශේෂයෙන් ඉහත නියෝග 5 ප්‍රකාර කටයුතු කරනු ලබන දීසාභාර නි.පො.ප. වරයා ද, ඉතා වගකීමෙන් යුක්තව මෙහිදී කටයුතු කිරීම භාරයේ අපේක්ෂා කරනු ලැබේ.

8 සෑම ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍රයක්ම පොලිස් 307 පෝරමය ප්‍රකාර නිකුත් කල යුතු අතර, එහි පසු පිටෙහි දැක්වෙන කොන්දේසි වලට අමතරව පහත දැක්වෙන කොන්දේසි ද, බලපත්‍රය සමග බලපත්‍ර ලාභියා වෙත නිකුත් කල යුතුය.

8 : 1 ශබ්ද විකාශන බලපත්‍රය නිකුත් කරනු ලබන පරිශ්‍රයේ සීමාවෙන් ඔබ්බට එම ශබ්දය විස්තාරනය නොවන ලෙසට වග බලා ගත යුතුවේ.

8 : 2 ශබ්ද විකාශන යන්ත්‍රයේ ශබ්දය අදාල පරිශ්‍රයට පමණක් සීමා විය යුතුය.

8 : 3 අදාල ස්ථානයේ නිෂ්පාදනය කරනු ලබන ශබ්ද පරිමාව මහජනතාවට හිරිහැරයක් ඇති නොකෙරෙන පරිදි අවම මට්ටමට පහත් ස්වරයකින් යුතුව විකාශය කල යුතුවේ.

8 : 4 බලපත්‍රයේ සඳහන් කර ඇති වේලාව ඉක්මවා යන පරිදි ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීම සපුරා තහනම් වේ.

8 : 5 අදාල ස්ථානයේ පරිමාවට වැඩි දුරකට ශබ්ද විකාශය වන අයුරින් ආම්පන්න (බෆල් / හෝන් යනාදිය) නො යෙදවිය යුතුය.

8 : 6 ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍රයේ දක්වා ඇති ස්ථානය / පරිශ්‍රයෙන් පිටපත කිසිම ස්ථානයක ශබ්ද විකාශන යන්ත්‍ර / බෆල් / හෝන් යනාදිය සවිකර එමගින් මහාමාර්ගයේ රථ වාහන ගමනා ගමනයට එමෙන්ම මහජනයාට අවහිරයක් අපහසුතාවයක්, කරදරයක් වන අයුරින් කටයුතු නොකල යුතුවේ.

8 : 7 මෙම ස්ථානයේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීමට එන පොලිස් නිළධාරීන් විසින් අවස්ථානුකූලව දෙනු ලබන නීත්‍යානුකූල විධානයන්ට බලපත්‍රලාභියා යටත් විය යුතුය.

9. ඒ සමගම බලපත්‍රය නිකුත් කිරීමේදී පහත සඳහන් තොරතුරුද ( පොලිස් 307 පෝරමයේ දක්වා ඇති කරුණු වලට අමතරව) මෙම බලපත්‍රයේ පැහැදිලිව ඇතුලත් කිරීමට වග බලා ගත යුතුය.

9 : 1 බලපත්‍ර නිකුත් කරනු ලබන යන්ත්‍රය කුමක්ද යන්න ( ග්‍රැමෆෝනය, ශබ්ද විකාශන යන්ත්‍රය, ශබ්දවාහිනී යන්ත්‍රය, බගල්, හෝන් හෝ සෙසු උපකරණ )

9 : 2 යන්ත්‍රය පාවිච්චි කරන වේලාව නිශ්චිතව

9 : 3 එකී යන්ත්‍රය පාවිච්චි කරන ස්ථානය / ප්‍රදේශය / මාර්ගය එහි දැක්වීම

9 : 4 බලපත්‍රය නිකුත් කරන්නේ කොපමන ප්‍රමාණයකින් යුක්ත යන්ත්‍ර උපකරණ කවිටල භාවිතා කිරීමට ද යන වග

10.. ශ්‍රේෂ්ඨාධිකරණයේ v වන නියෝගය අනුව දිස්ත්‍රික් භාර නිළධාරියා විසින් නිකුත් කරනු ලබන සෑම ශබ්ද විකාශන බලපත්‍රයකම පිටපතක් අදාල ස්ථාන භාර නිළධාරියාට යැවිය යුතු අතර, ස්ථානාධිපතිවරයා සෑම ශබ්ද විකාශන බලපත්‍රයක්ම නිකුත් කරනු ලබන ස්ථාන වලට ප්‍රමාණවත් පරිදි පොලිස් නිළධාරීන් යොදවා, දී ඇති කොන්දේසි වලට අනුව ( පොලිසේ පෝරම 307 පසුපිටේ දැක්වෙන කොන්දේසි මෙන්ම ඉහත නියෝග 8 හා 9 දැක්වෙන කොන්දේසි ") බලපත්‍ර ලාභියා අදාල බලපත්‍රය පාවිච්චි කරන්නේද යන්න සොයා බැලිය යුතුය. මෙහිදී එම පොලිස් නිළධාරීනට වගකීමෙන් යුක්තව අදාල නිරීක්ෂණයන් සිදු කිරීම සඳහා පැහැදිලි නියෝග හා උපදෙස් ස්ථානාධිපති වරයා විසින් ලිඛිතව ලබා දිය යුතුය.

11. අදාල ස්ථානයේ නිරීක්ෂණයන් සිදුකිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව තම සාක්කු සටහන් පොතේ මෙන්ම තොරතුරු සටහන් පොතේ නිසි සටහන් ඔවුන් යෙදිය යුතු අතර, ඉන් පසුව අදාල කණ්ඩායම් භාර ජ්‍යෙෂ්ඨ නිළධාරියා අදාල ස්ථාන නිරීක්ෂණය පිළිබඳ වාර්තාවක් ස්ථානාධිපති වරයාට යොමු කල යුතුය. ස්ථානාධිපති වරයා නොපමාව ඒ පිළිබඳ ඔහුගේ නිරීක්ෂණ හා නිර්දේශයන් දක්වා එම වාර්තාව දිස්ත්‍රික් භාර නිළධාරියා වෙත යොමු කල යුතු වන අතර, මෙහිදී බලපත්‍ර ලාභියා කොන්දේසි වලට අනුකූලව කටයුතු කල ආකාරය පිළිබඳව එහි විස්තර දක්වා තිබීම අවශ්‍ය වේ.

12. සෑම පොලිස් ස්ථානයකම ශබ්ද විකාශන බලපත්‍ර නිකුත් කිරීම හා සම්බන්ධයෙන් පහත දැක්වෙන විෂයන් පරිදි ලේඛණයක් පවත්වාගෙන යා යුතු අතර, මෙය " ශබ්ද විකාශන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛණය " යනුවෙන් නම් කල යුතුය. එමෙන්ම එම ලේඛණය ස්ථානාධිපති වරයාගේ පොත් ලේඛණයට ලේඛණයක් ලෙස ඇතුලත් විය යුතුය.

i අනු අංකය

ii . බලපත්‍ර අංකය හා නිකුත් කල දිනය

iii බලපත්‍ර ලාභියාගේ නම ලිපිනය හා හැඳුනුම් පත් අංකය

iv බලපත්‍රය හා සම්බන්ධ ස්ථානය / පරිශ්‍රයේ ලිපිනය

v බලපත්‍රයට අනුව ශබ්ද විකාශනය පැවැත්විය යුතු දිනය හා කාල පරිච්ඡේදය

vi දිසාභාර නි.පො.ප. විසින් අනුමැතිය ලබා දුන් දිනය හා යොමුව ( පැය 22.00 සිට පැය 06.00 දක්වා අතර කාලය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා පමණි)

vii අදාල ස්ථානය හා සම්බන්ධයෙන් පෙර විපරම් කල නිළධාරියා ( පැය 22.00 සිට පැය 06.00 දක්වා අතර කාලය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා පමණි)

viii බලපත්‍රයේ දැක්වෙන ස්ථානයේ රාජකාරි නියුකත්ව සිටි නිළධාරීන්

ix ඔවුන්ගේ පිටවීම පැමිණීම හා තොරතුරු පොතේ යොමුව

x වෙනත් කරුණු

13 ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 261 වන වගන්තිය හා පොලිස් ආඥා පනතේ 80 වන වගන්තිය උල්ලංඝනය වන පරිදි මහජන පීඩාවක් හෝ නැතහොත් ශබ්ද විකාශන හෝ ඇම්ප්ලිෆයර් එකක් හෝ එවැනි උපකරණයක් භාවිතා කිරීම මගින් මහජනතාවට හෝ යම් ප්‍රදේශයක පදිංචි කරුවන්ට බාධා පැමිණෙන බවට පොලිසියට කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් වහාම ක්‍රියාමාර්ග ගැනීමට සියලුම පොලිස් ස්ථාන භාර නිළධාරීන් ක්‍රියා කල යුතු අතර, එවැනි අවස්ථාවන්හිදී වහාම පොලිස් නිළධාරීන් එම ස්ථානයේ බලපත්‍ර නොමතිව ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කරනු ලබන අවස්ථාවලදී භාණ්ඩ හා උපකරණ සිය භාරයට ගැනීමට කටයුතු කල යුතුවේ.

14. බලපත්‍රයේ අඩංගු කොන්දේසි උල්ලංඝණය කිරීමක් සිදුවීමෙන් අවට මහජනතාව පීඩාවට පත් වන ලෙස ශබ්ද විකාශන උපකරණ භාවිතා කරන අවස්ථා වලදී පොලිස් ආඥා පනතේ 80 (4) වගන්තිය යටතේ එම උපකරණ වල ශබ්දය පාලනය කරන ලෙසට පරීක්ෂණ ශ්‍රේණියෙන් ඉහල නිළධාරියෙක් එම ස්ථානයට ගොස් එම උපකරණ භාරව සිටින පුද්ගලයාට හෝ බලපත්‍ර ලාභියාට අවවාද කල යුතු අතර, එම අවවාද නොතකා දිගින් දිගටම ක්‍රියා කරන්නේ නම් ශබ්ද විකාශන යන්ත්‍ර සහ අදාල භාණ්ඩ පොලිස් භාරයට ගත යුතුය. එසේ කිරීමෙන් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණයේ vi වන නියෝගය· ප්‍රකාර ඒ සම්බන්ධයෙන් නොපමාව අධ්‍යක්ෂ /පොලිස් නීති කොට්ඨාශය හරහා ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරි වෙත වාර්තා කිරීමට කටයුතු කල යුතුය.

15. දැනට බලපත්‍ර ලබා ගැනීමකින් තොරව සෑම නගරයකම පවත්වා ගෙන යනු ලබන ලොතරැයි වෙළඳ කුටි එමෙන්ම, ජංගම ලොතරැයි වෙළඳුන් පාවිච්චි කරනු ලබන ශබ්ද විකාශන වල ක්‍රියාකාරීත්වය වහාම ක්‍රියාත්මක වන පරිදි නතර කල යුතු අතර, කිසිම අවස්ථාවකදී ඒ සඳහා බලපත්‍ර ලබා නොදිය යුතුය.

16. ත්‍රිවිල් රථවල සවිකර ඇති අධිධාරිතාවෙන් යුත් කැසට් පට, රේඩියෝ යන්ත්‍ර ක්‍රියා කරවීමට ඉඩ නොදිය යුතු අතර, ඒවා ගලවා එසේ නොකරන ලෙසට ඔවුන්ට අවවාද කල යුතුය.

17. සියලුම රෙකෝඩ් බාර් (සංගීත හැටි අලෙවි මධ්‍යස්ථාන) වලින් පිටතට ඇසෙනසේ ශබ්ද විකිදුවා ලමින් අධිධාර්තාවෙන් යුතුව බෆල් මගින් සංගීතය පැතිරවීම වහාම නතර කල යුතුය. එම අවස්ථා සඳහා බලපත්‍ර නිකුත් නොකල යුතුය.

18. නාගරිකව දැනට සම්පූර්ණ නගරය ආවරණය වනසේ යම් යම් ආයතන, කණ්ඩායම් විසින් වෙළඳ ප්‍රචාරයන් පවත්වාගෙන යන ශබ්ද විකාශන සේවාවන් වහාම නතර කල යුතු වන අතර මේ සඳහා මින් ඉදිරියට බලපත්‍ර නිකුත් නොකල යුතුය.

19. විශේෂයෙන් සංගීත සංදර්ශණ සඳහා බලපත්‍ර ලබා දිය යුත්තේ ශ්‍රේෂ්ඨාධිකරණ නියෝග වලට අනුකූලවන පරිදි රාත්‍රී 10.00 දක්වා පමණි. මෙහිදී එම නියෝගයේ දැක්වෙන උපදෙස් තරයේ පිලිපැදිය යුතුය.

20. ආගමික සිද්ධස්ථාන ( පන්සල්, පල්ලි, දේවස්ථාන, කෝවිල් යනාදිය) වල දෛනික ක්‍රියාකාරකම්, සඳහා වුවද, ශ්‍රේෂ්ඨාධිකරණ නියෝග iii හා ඉහත නියෝග 3 ප්‍රකාර පැය 22.00 සිට පැය 06.00 දක්වා ආගමික සිද්ධස්ථාන වලට ශබ්ද විකාශන බලපත්‍ර නිකුත් නොකල යුතුය.

21. පැය 06.00 සිට පැය 22.00 දක්වා විශේෂ ආගමික සිද්ධස්ථාන ක්‍රියාකාරකම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දී ඇති උපදෙස් හා නියෝග මෙන්ම එයට සමගාමීව ඉහත දක්වා ඇති නියෝගයන් ප්‍රකාර සිදු කල යුතු අතර, එම බලපත්‍ර ලාභීන් අදාල ආගමික ස්ථානයන් හිදී ප්‍රතිනිෂ්පාදනය කරනු ලබන ශබ්ද පරිමාව මහජනතාවට හිරිහැරයක් ඇති නොකෙරෙන පරිදි අවම මට්ටමට පහත් ස්වරයකින් විකාශනය කරවිය යුතු බවට බලපත්‍රය නිකුත් කිරීමේදී ඉහත නියෝග 8 හා 9 ප්‍රකාර කොන්දේසි පැනවිය යුතුය.

22. වෙසක් උත්සවය, පොසොන් උත්සවය, නත්තල් උත්සවය, මුස්ලිම් හා දමිළ වාර්ෂික ආගමික උත්සව, නුවර පෙරහැර,කැළණි පෙරහැර, කතරගම පෙරහැර, කෝට්ටෙ පෙරහැර, බෙල්ලන්විල පෙරහැර, රත්නපුර සමන් දේවාල පෙරහැර හා කොළඹ නවම් පෙරහැර ආදි විශේෂ ආගමික උත්සව වලදී මෙන්ම සිංහල අලුත් අවුරුදු උත්සවය, නිදහස් උත්සවය, මැයි දින උත්සවය වැනි විශේෂ අවස්ථා වලදී ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයන්ට හා මෙම චක්‍ර ලේඛණයේ දැක්වෙන උපදෙස් හා නියෝගයන්ට අනුකූලව කටයුතු කරමින් අවස්ථානුකූලව ශබ්ද වාහිණි බලපත්‍ර නිකුත් කල යුතුය.

23. කෙසේ වෙතත්, කිනම් අවස්ථාවක හෝ දන්සැල් වලට ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍ර ලබා නොදිය යුතුය.

24. දිප ව්‍යාප්ත ශබ්ද විකාශන බලපත්‍ර නිකුත් කිරීම ( දිස්ත්‍රික්ක කිපයක් හරහා ක්‍රියාත්මක වන වැඩ සටහන් පොලිස් මූලාස්ථානයෙන් නිකුත් කරනු ලබන ශබ්ද විකාශනය යන්ත්‍ර බලපත්‍ර ) මින් ඉදිරියට ජ්‍යෙ/ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන මගින් නිකුත් කල යුතු වන අතර, මෙම නිකුත් කිරීම් වලදී ද, ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයන්ට මෙන්ම

මෙම චක්‍ර ලේඛයේ දැක්වෙන උපදෙස් වලට පරිබාහිර නොවන අයුරින් ඒවා නිකුත් කිරීමට කටයුතු කල යුතුය.

ඉහත දක්වා ඇති නියෝග තරයේ ක්‍රියාත්මක කිරීම සියලුම දිසාභාර / කොට්ඨාශ භාර/ දිස්ත්‍රික් භාර / ස්ථාන භාර නිළධාරීන් විසින් ඉටු කිරීම මා තරයේ අපේක්ෂා කරන අතර, මෙම නියෝගයන්ට විශේෂයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති හා නියෝගයන්ට පරිබාහිරව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය මහපනතාවට යම් අපහසුතාවයක්, කරදරයක්, හිරිහැරයක් හෝ බාධාවක් ඇතිවී ඇති බවට යම් පැමිණිල්ලක් ලැබීමම අදාල කොට්ඨාශ භාර / දිස්ත්‍රික් භාර / ස්ථාන භාර නිළධාරීන්ට විරුද්ධව තදබල ලෙස විනයානුකූලව කටයුතු කිරීමට හේතු සාධක වනු ඇත.

සියලුම දිසාභාර නි.පො.ප. වරුන් තම දිසාවේ සියලුම කොට්ඨාශ භාර / දිස්ත්‍රික් භාර / ස්ථාන භාර නිළධාරීන්ට විශේෂ උපදෙස් පන්තියක් පවත්වා මෙම ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය එමෙන්ම එම නියෝගයට සමගාමීව නිකුත් කර ඇති මේ චක්‍ර ලේඛයේ දැක්වෙන නියෝග පිළිබඳව කරුණු පැහැදිලි කර දිය යුතුය.

එමෙන්ම සියලුම දිසාභාර නිළධාරීන් හා කොට්ඨාශ භාර නිළධාරීන් මෙම චක්‍ර ලේඛණයේ ප්‍රකාර කොට්ඨාශ මට්ටමින් සිදුවිය යුතු ක්‍රමවේදය පිළිබඳව දිසා / කොට්ඨාශ ස්ථාවර නියෝග නොපමාව නිකුත් කල යුතුය.

සියලුම දිස්ත්‍රික් භාර නිළධාරීන් හා ස්ථාන භාර නිළධාරීන්ද මේ පිළිබඳව තමා යටතේ සිටින සියලුම නිළධාරීන් / නිළධාරිනියන් හට උපදෙස් පන්ති පවත්වා මෙම කරුණු පිළිබඳව මවුන්ට ඉතා පැහැදිලි ලෙස දැනුවත් කල යුතුය.

(වික්ටර් පෙරේරා)
පොලිස්පති
වික්ටර් පෙරේරා
පොලිස්පති

**SUPREME COURT DIRECTION IN TERMS OF ARTICLE 126(4) OF THE CONSTITUTION DATED 09th NOVEMBER 2007 IN CONNECTION WITH THE SC APPLICATION NUMBER 38/2005(FR)**

i) That the emission of noise by use of amplifiers, loudspeakers or other equipment or appliances which causes annoyance to the public or to the people in general who dwell or occupy property in the vicinity be considered a public nuisance in terms of Section 261 of the Penal Code and that the Police should entertain complaints and take appropriate action for the abatement of such public nuisance;

ii) That all permits issued by the Police under Section 80(1) of the Police Ordinance shall cease to be effective forthwith;

iii) That no permits shall be issued in terms of Section 80(1) of the Police Ordinance for the use of loudspeakers and other instruments for the amplification of noise as specified in that section covering the period 10 p.m (night) to 6 a.m (morning). Such permits may be issued for special religious functions and other special events only after ascertaining the views of persons who occupy land premises in the vicinity, a record of such matters to be maintained and the grant of any such permit shall be forthwith reported to the nearest Magistrates Court;

iv) That in respect of the hours from 6.00 a.m to 10.00 pm permits may be issued for limited period of time for specific purpose subject to the strict condition that the noise emitted from such amplifier or loudspeaker or equipment does not extend beyond the precincts of the particular premises;

v) Where a permit is issued in terms of Section 80(1) as provided in direction (iii) and (iv) sufficient number of Police Officers should be designated and posted to the particular place of use to ensure that the conditions imposed are strictly complied with;

vi) That the Police will make special arrangements to entertain any complaint of a member of the public against any person guilty of an offence of public nuisance as provided in Section 261 of the Penal Code or of using any loudspeaker, amplifier or other instruments as provided in Section 80 of the Police Ordinance contrary to any of these directions and take immediate steps to investigate the matter and warn such person against a continuance of such conduct. If the conduct is continued after that warning to seize and detain the equipment as provided in Section 80(4) of the Police Ordinance and to report the matter to the Registrar of this Court.